**පොල් වගා කිරීමේ මණ්ඩලය**
**9/ 428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

## ඉතිහාසය

පොල් වගාකිරීමේ මණ්ඩලය වර්ෂ 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනත යටතේ ශ්‍රී ලංකාව තුළ විසිරී සිටින පොල් වගාකරුවන්ට අවශ්‍ය මගපෙන්වීම කරමින් අවශ්‍ය ආධාර උපකාර ලබාදීමේ අපේක්ෂාවෙන් ගැසට් පත්‍ර නිවේදනයකින් ස්ථාපිත කරන ලදී. පොල් වගාකිරීමේ මණ්ඩලය මූල්‍ය ආධාර හා ද්‍රව්‍යමය ආධාර ලබා දෙමින් පොල් ඉඩම්වල ඵලදාව හා තිරසාර සංවර්ධනයක් පොල් ඉඩම්වල පවත්වා ගැනීමට වගාකරුවන් දිරිමත් කෙරේ. තවද තවාන් 35ක් මගින් පොල් වගාකරුවන්ගේ පොල් පැල අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ගුණාත්මයෙන් යුත් පොල් පැල ලබාදේ.

## ප්‍රධාන අංශ

1. ආයතන හා පිරිස්බල සංවර්ධන අංශය
2. ව්‍යාප්ති හා ගොවිපල සැලසුම් අංශය
3. මූල්‍ය කළමනාකරණ අංශය
4. බීජ හා රෝපණ ද්‍රව්‍ය අංශය
5. සැලසුම් අංශය
6. අභ්‍යන්තර විගණන අංශය

## අරමුණු

- පොල් වගාකරුවන් වෙත අවශ්‍ය දැනුම හා තොරතුරු ලබා දෙමින් ඔවුන්ගේ අභිප්‍රාය වූ ඵලදායිතාවය වැඩි දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය දැනුම ලබාදීම. එමගින් ඉදිරි වර්ෂ තුන තුලදී පොල් මිලියන 3500ක් වාර්ෂික ඉලක්කයක් වෙත ලබා දීම.
- පොල් නිෂ්පාදනය අඩාලවූ බිම් හා අළුතින් වගා කලහැකි බිම් අක්කර මිලියන 1 ක අළුතින් පොල් වගා කිරීම සඳහා පැල හා මූලික පොහොර වගා කරුවන් වෙත ලබාදීම.
- පොල් ඉඩම්වල ඵලදායිතාවය වැඩි කිරීම හා උපරිම ආදායමක් ලබාදීම සඳහා පොල් වගාකරුවන් හට ඔවුන්ගේ ඉඩම්වල පොල් සමඟ බහුවිධ භෝග වගාකිරීම සඳහා සහයෝගය ලබා දීම.

## ක්‍රියාකාරකම්

පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් සේවාවන් ගණනාවක් ලබාදේ. මෙම වැඩසටහන් කාලානුරූපීව හා වගාකන්න අනුව විවිධ වෙනස්කම් පෙන්නුම් කරයි. පහත සඳහන් අංග 4ක් යටතේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ ක්‍රියාකාරකම් විස්තර කල හැක.

1. උපදේශණ හා ව්‍යාප්ති සේවාව
2. යෙදවුම් හා ද්‍රව්‍යමය ආධාරයන්
3. භාගිකව මූල්‍යාධාර සැපයීම
4. පොල් ඉඩම් සංවර්ධනය සඳහා ණය ආධාර

## සම්බන්ධවිය හැකි පුද්ගලයන්

| නම | දුරකථන අංකය | ෆැක්ස් | ඊ - මේල් |
|---|---|---|---|
| සභාපති, ආචාර්ය එච්.ඒ.ජේ. ගුණතිලක මහතා | 5549501 | 5549507 | ccb@sltnet.lk |
| සාමාන්‍යාධිකාරී, එස්.සුජාතා කුරේරා මිය | 5549502 | 5549507 | ccb.gm@sltnet.lk |

| | | | |
|---|---|---|---|
| සාමාන්‍ය | 2861331 | 5549507 | ccb@sltnet.lk |

**වෙබ් අඩවිය:** www.coconut.gov.lk